දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
Bachelor of Arts General (External) Degree Part II Regular Examination 2015 – July/August 2018

සවිසා 3.1 - සංවර්ධන සමාජ විද්‍යාව
SGYG 3.1 - Sociology of Development

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය

---

01. i. සංවර්ධනය මැනීම පිළිබඳ ආර්ථික නිර්ණායක මොනවාදැයි හඳුන්වන්න.
(ලකුණු 04)

ii. එම ආර්ථික නිර්ණායකවලින් <u>දෙකක්</u> තෝරාගෙන සංවර්ධනය මැනීම සඳහා ඒවා යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 06)

iii. "ආර්ථිකමය නිර්ණායක සංවර්ධනය මැනීම සඳහා යොදාගත හැකි පරිපූර්ණ දර්ශකයක් නොවේ." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(ලකුණු 10)

02. i. ග්‍රාම සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(ලකුණු 04)

ii. ග්‍රාම සංවර්ධනයේ දී භාවිතා වන ප්‍රවේශයන් <u>දෙකක්</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධන විෂයෙහි ලා සමෘද්ධි <u>හෝ</u> ජනසවිය ව්‍යාපෘති මගින් දක්වා ඇති දායකත්වය ප්‍රමාණය කරන්න.
(ලකුණු 10)

03. i. තිරසාර සංවර්ධනය නිර්වචනය කරන්න.
(ලකුණු 04)

ii. තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය වර්තමානයේ බෙහෙවින් වැදගත් ලෙස සැළකීමට බලපා ඇති හේතු මොනවා ද?
(ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ නිදහසින් පසු ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති <u>දෙකක්</u> තෝරාගෙන ඒවා තිරසාර සංවර්ධනය නම් සංකල්පය සමග සම්බන්ධ වන ආකාරය සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

04. i. සාපේක්ෂ හා නිරපේක්ෂ දුගී භාවය යන්නෙන් කුමක් අදහස් වන්නේ දැයි පෙන්වා දෙන්න.
(ලකුණු 04)

ii. "දිළිඳු බවේ විෂම චක්‍රය" හා "ආකල්ප සංවර්ධනය" නම් සංකල්ප පැහැදිලි කරන්න.
(ලකුණු 06)

iii. "ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ දිළිඳු බව පිටුදැකීමේ ව්‍යාපාරවලින් අපේක්ෂිත අරමුණු කලින් කලට වෙනස් වී ඇත." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(ලකුණු 10)

05. i. 'හරිත විප්ලවය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(ලකුණු 04)

ii. 'හරිත විප්ලවය' මගින් අපේක්ෂා කළ අරමුණු මොනවා ද?
(ලකුණු 06)

iii. එම අරමුණු සාධනයෙහි ලා 'හරිත විප්ලවය' දායක වී ඇති ආකාරය ශ්‍රී ලංකා සමාජය ඇසුරින් විමසන්න.
(ලකුණු 10)

06. i. දේශීය (සාම්ප්‍රදායික) ඥානය යනු කුමක් ද?
(ලකුණු 04)

ii. සංවර්ධනය සඳහා දේශීය ඥානය යොදා ගැනීමේ ඇති වැදගත්කම ඔබ දකින්නේ කෙසේ ද?
(ලකුණු 06)

iii. කෘෂිකාර්මික පිළිවෙත්, ආහාර පුරුදු, රෝග නිවාරණ ක්‍රම යන ඒවායින් <u>දෙකක්</u> තෝරාගෙන ඒ හා සම්බන්ධ දේශිය ඥානය සංවර්ධනය සඳහා යොදා ගත හැකි ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

07. i. සංවර්ධනය පිළිබඳ නවීකරණ න්‍යාය යනු කුමක් ද?
(ලකුණු 04)

ii. එමිල් ඩර්කයිම්, කාල් මාක්ස්, මැක්ස් වෙබර් යන සම්භාවය නවීකරණ වාදීන්ගෙන් <u>දෙදෙනෙකු</u> නවීකරණය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් මොනවා දැයි පෙන්වා දෙන්න.
(ලකුණු 06)

iii. සංවර්ධනය පිළිබඳ නවීකරණ න්‍යාය පරිපූර්ණ විග්‍රහයක් බව ඔබ සිතන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(ලකුණු 10)

08. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> තෝරාගෙන ඒ සඳහා සටහන් ලියන්න.

i. අමාර්ත්‍ය සෙන්
ii. උපතේ දී ආයු අපේක්ෂාව
iii. යහපාලන මූලධර්ම
iv. දිළිඳු බවේ සංස්කෘතිය

(එක් පිළිතුරකට ලකුණු 10 බැගිනි)



xxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxx